# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2022/28 - 2017 ජූනි මස 07 වැනි බදාදා - 2017.06.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත් කරගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : අනු/10/5/4/ කුරු.06/චන්ද්‍රානි ලියනගේ.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : එල්ඩී/4/2/5/(උ.මැ).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ ඇල්ලකට්ටුව ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙළ කරන ලද අ.ග.පි. 1399 හි අතිරේක පත්‍ර අංක හි හෙක්ටයාර් 0.0600 පමණ වූ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම් :

අ.ග.පි. 1399

**කැබලි අංක 273 න් කොටසක්; ඉඩමේ නම: ඇල්ලකට්ටුවත්ත; හිමිකම් කියන්නා: චන්ද්‍රානි ලියනගේ මහත්මිය හා වජිරා ධම්මචාරිණී සිල්මාතාව ; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0600**

මායිම් :

*උතුරට*: කැබලි අංක 266; *නැගෙනහිරට*: කැබලි අංක 273 න් කොටසක්; *දකුණට*: කැබලි අංක 274; *බටහිරට*: කැබලි අංක 272.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජූනි මස 28 වැනි දින පෙ. ව. 9.30 ට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජූනි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ජී. ඒ. කිත්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
මධ්‍යම නුවරගම් පළාත.

2017 ජූනි මස 05 වැනි දින
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,
මධ්‍යම නුවරගම් පළාත,

06 - 825


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 25687 - 13 - (2017/06)
)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.